# නැඳුන්ගමුවේ පාරම්පරික වෛද්‍ය ක්‍රමයේ සුවිශේෂතා

වෛද්‍ය එච්. ඩී. ඒ. පී. ජයතුංග

මනුෂ්‍ය ශිෂ්ටාචාරයේ ආරම්භයත් සමඟ ම ලෙඩ රෝග සුව කර ගැනීම සඳහා මෙන් ම නිරෝගී බව රැක ගැනීම සඳහා ඔවුනොවුන් අතර වූ සෞඛ්‍යාරක්ෂිත උපක්‍රමයන් ගෙන් ගොඩනැගුණු දේශීය වෛද්‍ය විද්‍යාව වසර පන්දහසක් පමණ දිගු ඉතිහාසයක ට උරුමකම් කියයි. අතීතයේ වෛද්‍යවරුන් ගේ අත්දැකීම් සහ භාරතීය ආයුර්වේද වෛද්‍ය විද්‍යාව අනුසාරයෙන් ක්‍රමයෙන් පෝෂණය වූ ශ්‍රී ලාංකීය දේශීය වෛද්‍ය ක්‍රමය එවක සිටම ගෞරවාන්විත සේවාවක් විය. දේශීය වෛද්‍යවරයෙකු යටතේ අධ්‍යයනය ලබමින් දේශිය චිකිත්සාව පිළිබඳ දැනුම ලබා ගැනීම මෙම අධ්‍යනයේ ප්‍රධාන අරමුණ විය.

ගම්පහ සිද්ධායුර්වේද වෛද්‍ය විද්‍යාලයේ නිර්මාතෘ දිවංගත ජී. පී. වික්‍රමාරච්චි වෙද පරපුරට නෑකම් කියන  නැඳුන්ගමුව වෙද පරපුර අතීතයේ සිට අද දක්වාම දසදහසක් රෝගීන් සුවපත් කරනු ලබයි. වෛද්‍ය ලිවියන් පෙරේරා පඩුවාවල, වෛද්‍ය බැස්තියන් පෙරේරා යන මහත්වරුන්ගේ ඇවෑමෙන් වෛද්‍ය පී.ඩී.පී ධර්මවිජය මහතා මෙම වෛද්‍ය කර්මයේ නියතුව ඇත. එතුමා ගේ පුත් හර්ෂ ධර්මවිජය මහතා මෙම පරපුරෙහි වර්තමාන වෛද්‍යවරයා ලෙස කටයුතු කරයි. අතීතයේ පාරම්පරික වෛද්‍යවරයා තුළ පැවතුණු යහපත් ඇවතුම් පැවතුම් වර්තමානයේ ද දේශීය පාරම්පරික වෛද්‍යවරයා තුළ විරාජමාන වන බවට එක් පැහැදිලි නිදසුනක් ලෙස මෙතුමා හැඳින්විය හැකිය.

වෛද්‍යවරයෙකුගේ ප්‍රධාන අධ්‍යයන මාර්ග වන ඇසූ පුරුද්ද, දැක පුරුද්ද, කළ පුරුද්ද සහ පළපුරුද්ද යන චතුර්විධ අංගයන් මැනවින් පිළිබිඹු වන මෙතුමා අසල එකල වෛද්‍යවරයා වෙත පැමිණෙන රෝගියා අත වූ බුලත් හුරුල්ල මෙකල ද දැකිය හැකිය. මෙම චාරිත්‍රය තුළින් වෛද්‍යවරයා සහ රෝගියා අතර ගොඩනැගෙන සබඳතාවය ද්‍රව්‍යයක ප්‍රභාව මෙන් වචනයෙන් විස්තර කළ නොහැක. පැමිණෙන රෝගියාගේ අපහසුතාවයන් හට සවන් දෙමින් රෝගී පරීක්ෂාවේ යෙදෙන අතර සෑම රෝගියෙකුගේ ම නාඩි පරීක්ෂා කිරීම සුවිශේෂී අවස්ථාවකි. වෛද්‍යක්‍රමය තුළ වූ මනෝ මූලික චිකිත්සාව ද මෙම අවස්ථාවේ දී ක්‍රියාත්මක කෙරේ. වාර්තාවන්ට හසු නොවීමෙන් අධිකව පීඩා විඳින මෙවන් අයගේ රෝග නිදානානුකූලව හඳුනා ගත් පසුව සුළු නිල ස්ථානයක් හෝ කිහිපයක් උද්දීපනය මගින් ක්ෂණික සහනයක් සලසා දෙනු ලැබේ. රෝග හඳුනාගැනීම මෙන්ම ඖෂධ යෙදීම සහ ආහාර විහරණයන්හි පත්‍යාපත්‍ය භාවිතය ද චිකිත්සාවේ දී  අවස්ථානුකූලව යොදනු ලැබීම ආතුර පරායණයට ප්‍රධාන මාර්ගයයි. පොත පතින් මෙන්ම පාරම්පරිකව ලද අත්දැකීම් සමුදායක් ඇසුරින් ගොඩනැගුණු චිකිත්සා ක්‍රියාවලියක් මේ සඳහා යොදාගනු ලබයි. කෂාය යෙදීම මෙම චිකිත්සා අතර සුවිශේෂී දෙයකි. පාරම්පරික කෂාය වට්ටෝරු වලට අමතරව ගුලි බෙහෙත, බොන බෙහෙත, කල්ක බෙහෙත සහ තෙල් හෝ වෙනත් ඖෂධ ආලේපන වශයෙන් යොදයි. වට්ටෝරු කෂාය යෙදීම අපහසු අවස්ථාවල ඊට අනුකූල ඵාණ්ට, චූර්ණ ආදිය යෙදේ.

ඖෂධ භාවිතය මෙන්ම පත්‍යාපත්‍ය භාවිතයද  චිකිත්සාවේ වැදගත්ම අංශයක් ලෙස සලකන මෙම පරම්පරාව ඒ පිළිබඳ රෝගියා දැනුවත් කිරීම අනිවාර්යය අංගයක් ලෙස සිදුකරනු ලබයි. විශේෂයෙන්ම රෝග නිදාන වලින් වැළකීමට අපත්‍ය ආහාර විහරණය බැහැර කිරීමත් පත්‍ය දේ ලඟා කර ගැනීමත් තුළින් ඉක්මන් සුවය මෙන් ම රෝගයේ නැවත හටගැන්ම වළක්වා ගැනීමට හැකි වේ. ඖෂධ යෙදීමේ දී ද ඒ ඒ රෝග සහ ඖෂධ සඳහා විශේෂිත පත්‍යාපත්‍ය ක්‍රම මෙම පරම්පරාව විසින් භාවිතා කරනු ලැබේ. වර්තමානයේ දී සුළු නමුත් වැදගත් කරුණු අතපසු කිරීමෙන් රෝගය සුව වීම වෙනුවට රෝගී තත්වය වැඩිවීමෙන් රෝගීන් මැසිවිලි නගන්නේ වෛද්‍යවරයා ද අපකීර්තියට ලක් කරමින් සහ ආයුර්වේද වෛද්‍ය ක්‍රමයට ඇති රුචිකත්වය ද බැහැර කරමිනි. එබැවින් නැඳුන්ගමුවේ පාරම්පරික වෛද්‍ය ක්‍රමයේ පවතින සුවිශේෂතාවයන් පිළිබඳ අවධානය යොමු කරමින් එම සුවිශේෂීතාවයන් ප්‍රතිකාරයට යොදා ගනිමින් අනාගත පරම්පරාවට ද ශ්‍රී ලාංකීය දේශීය වෙදකම උරුම කර දීම අප සතු වගකීමකි.